මගේ අංකය
එනது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No .

දිනය
திகதி
Date.
2018.07.13

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**Human Rights Commission of Sri Lanka**

අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති
ජනාධිපති ලේකම් කාර්යාලය
කොළඹ 01

අතිගරු ජනාධිපතිතුමනි,

<u>මරණ දඬුවම ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරිපත් වී ඇති යෝජනාව පිළිබඳවයි</u>

අධිකරණය විසින් මරණ දඬුවම නියම කොට ඇති මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට විරුද්ධව එම දඬුවම ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය දී ඇති බවත්, එවැනි සිරකරුවන් බන්ධනාගාරයතුල සිට තවදුරටත් එම මත්ද්‍රව්‍ය ජාවාරමේ යෙදෙන්නේ නම් ඔවුන්ට විරුද්ධව එම දඬුවම වහාම ක්‍රියාත්මක කිරීමට රජය එකඟ වන බවත් පසුගිය දින කිහිපය තුල මාධ්‍ය වාර්තා මඟින් අප දැනුවත් විය. මේ ප්‍රවෘත්තිය කෙරෙහි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සිය දැඩි කනස්සල්ල පළ කර සිටියි.

2016 ජනවාර් 01 දාතමින් යුතු ලිපියක් මඟින් අප කොමිෂන් සභාව ශ්‍රී ලංකාව මරණ දඬුවම අහෝසි කළ යුතු යැයි සවිස්තරාත්මක ලෙස කරුණු දැක්වූ නිර්දේශයක් ඔබ තුමාට ඉදිරිපත් කරන ලදී (ඇමුණුම). එහිදී අප දක්වා සිටියේ මරණ දඬුවම ඉතාමත්ම කෲර සහ අමානුෂික දණ්ඩනයක් බවත් එයින් ජීවිතයට ඇති අයිතියද කෲර සහ අවමන් සහගත දඬුවම් වලින් මිදී සිටීමට ඇති අයිතිය ද වෙනත් මානව හිමිකම් ද ප්‍රබල ලෙස උල්ලංඝනය කරනු ලබන දඬුවමක් බවත්, අන්තගාමී හා වෙනස් කළ නොහැකි වූ හා අපරාධ මර්දනය කිරීම සඳහා නිෂ්ඵල වූ දඬුවම් ක්‍රමයක් නිසාත් මරණ දඬුවම අහෝසි කළ යුතු බවයි.

මත්ද්‍රව්‍ය ජාවාරම හේතුවෙන් විශාල සමාජීය ප්‍රශ්න ඇතිවන බවත්, විශේෂයෙන්ම තරුණ පිරිස් මත්ද්‍රව්‍ය වලට අබ්බැහිවීම තුලින් රටේ අනාගත පරපුරට විශාල අහිසි බලපෑම් එල්ල වන බවත්, එහෙයින් මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් ඉතා දරුණු සමාජ විරෝධී ක්‍රියාවලියක යෙදෙන පුද්ගලයන් බවත් අපි පිළිගනිමු. නමුත් එය සාර්ථක ලෙස මැඩලීමට හැකි වන්නේ මරණ දඬුවම වැනි නිෂ්ඵල දඬුවම් ක්‍රියාත්මක කිරීමෙන් නොව මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් කාර්යක්ෂම ලෙස නීතියේ රැහැනට හසුකර ගැනීමත්, ඔවුන් සිදු කර ඇති අපරාධ වලට සරිලන ආකාරයේ වෙනත් බරපතල දඬුවම් පැමිණවීමත් යැයි අප කොමිෂන් සභාවේ මතය වේ.

දැනටමත් වරදකරුවන් වී බන්ධනාගාරගත වී ඇති ජාවාරම්කරුවන් බන්ධනාගාරය තුලදීත් බාහිර ලෝකයත් සමග නව තාක්ෂණය මඟින් බද්ධවී එම ජාවාරම් වල යෙදෙන්නේ නම් එයට නිසි පිළිතුර විය

ප්‍රධාන කාර්යාලය / தலைமைக் காரியாலயம் — 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு-04.
සභාපති / தவிசாளர் / Chairperson — 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax — 011 2505541/74
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail — sechrcsl@gmail.com

යුත්තේ බන්ධනාගාරය තුල ඇති ආරක්ෂක කටයුතු නවීන තාක්ෂණය භාවිතා කරමින් තරකිරීමත්, මෙම ක්‍රියාවලියන්ට සම්බන්ධ නිලධාරීන් පිළිබඳ නිරන්තරයෙන් විමසිල්ලෙන් සිටිමින් ඔවුන්ට විරුද්ධව ප්‍රබල ලෙස නීති මාර්ගයෙන් කටයුතු කිරීමත් වේ. එමෙන්ම මත්ද්‍රව්‍ය ජාවාරම මෙසා ව්‍යාප්තවීමට ප්‍රධාන සාධකයක් වන්නේ මෙම මහා පරිමාණ ජාවාරම්කරුවන්ට යම් දේශපාලන සබඳතා සහ නීතිය ක්‍රියාත්මක කිරීමේ යම් අංශ වලින් ලැබෙන සහාය බැව් ප්‍රචලිත කරුණකි. එම හේතුකාරකයන් ආමන්ත්‍රණය නොකොට මරණ දඬුවම ක්‍රියාත්මක කිරීම වැනි ක්ෂණික සහ නිෂ්ඵල වූ විසඳුම් වලින් මෙම මත්කුඩු උවදුරෙන් අප සමාජය බේරා ගැනීමට සාර්ථක හා දීර්ඝකාලීනව හැකි නොවන බැව් අපට ප්‍රත්‍යක්ෂ වේ.

තවද, අපගේ නිරීක්ෂණය වන්නේ ශ්‍රී ලංකීය සමාජය තුළ මරණ දඬුවම පිළිබඳ වූ ප්‍රබල පක්ෂපාතිත්වය පිළිබඳව යම් කොටස් දැන් ප්‍රශ්න කිරිමේ ප්‍රවනතාවයක් වර්ධනය වී ඇති බවයි. එයට ප්‍රධාන හේතුව වන්නේ ශ්‍රී ලංකාව තුළ යුක්තිය පසඳලීමේ ක්‍රමවේදය පිළිබඳ ඇති විශ්වාසය පළුදු වීම යැයි නිරීක්ෂණය වේ.

මරණ දඬුවම පිළිබඳ අප ඉදිරිපත් කරන ලද 2016 නිර්දේශය මගින් මරණ දඬුවම අහෝසිකිරිම ලොව පුරා රටවල් බහුතරයක් අතර ඇති වර්ථමාන ප්‍රවනතාවයක් බව පෙන්වා දෙන ලදි. මරණ දඬුවම නීති පොතේ පැවතියත් 1976 වසරෙන් පසු ශ්‍රී ලංකාව මරණ දඬුවම ක්‍රියාත්මක නොකිරිම හේතුවෙන් ජාත්‍යන්තර පැසසුමට පාත්‍රවිය. මරණ දඬුවම ක්‍රියාත්මක නොකිරිම පිළිබඳව ශ්‍රී ලංකාව 2016 වසරේදී ද එක්සත් ජාතීන්ගේ මහා මංඩලය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවකට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදි. ප්‍රජාතන්ත්‍රවාදි මාවතට පිවිසීම පිළිබඳ ශ්‍රී ලංකාව අත්කරගත් ජාත්‍යන්තර කීර්තිය මරණ දඬුවම නැවත ක්‍රියාත්මක කිරිම වැනි ප්‍රතිපත්ති තුළින් පසුබෑමකට ලක්වීම වැලැක්විය නොහැක.

එසේ හෙයින් ශ්‍රී ලංකාව මානව හිමිකම් කොමිෂන් සභාව ඔබ තුමාගෙන් දැඩි අවධානයෙන් හා ගෞරව පූර්වකව ඉල්ලා සිටින්නේ මරණ දඬුවම නැවත ක්‍රියාත්මක කිරිමේ තින්දුව අහෝසිකොට, මත්ද්‍රව්‍ය ජාවාරම ඇතුලු බරපතළ අපරාධ මර්දනය කිරිම සඳහා අවශ්‍ය ප්‍රබල හා දිර්ග කාලීන ප්‍රතිපත්ති මාලාවක් (ආයතන සහ ක්‍රියාපටිපාටින් ශක්තිමත් කිරිම ඇතුලු) ක්‍රියාත්මක කරන ලෙසයි.

ආචාර්ය දිපිකා උඩගම
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Dr. N. D. Udagama**
Chairperson
Human Rights Commission of Sri Lanka